# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 1469 /2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2023

දිනය / திகதி / Date: 24/11/2023 පැය 2050

## මාධ්‍ය නිවේදනය

**නීති විරෝධී රැස්වීමක සාමාජිකයන්ව සිටිමින් කලහකාරී ලෙස හැසිරීම සම්බන්ධව පුද්ගලයන් 05 දෙනෙකු අත්අඩංගුවට - කොල්ලුපිටිය පොලිස් ස්ථානය.**

2023.11.24 වන අද දින සවස් කාලයේදී කොල්ලුපිටිය පොලිස් වසමේ පිහිටි ඇමරිකානු තානාපති කාර්යාලය ඉදිරිපිටට පැමිණි පිරිසක් විසින් ඊශ්‍රාලය විසින් පලස්තීනයට එල්ල කරන ම්ලේච්ඡ ප්‍රහාරය නවතා දමන ලෙස ඉල්ලමින් උද්ඝෝෂණයක් පවත්වන ලදී.

පසුව එම පිරිස මහජනතාවට සහ මාර්ගයේ ගමන් කරනු ලබන වාහන අවහිර වන අයුරින් රැගෙන එන ලද රිජිෆෝම් වලින් සකසන ලද අනුරූ කිහිපයක් පුළුස්සමින් කලහකාරී ලෙස හැසිරෙන ලදී. එම අවස්ථාවේදී මෙම තත්වය වැළැක්වීමට කටයුතු කළ නාරාහේන්පිට පොලිස් ස්ථානාධිපතිවරයා පිළිස්සුම් තුවාල ලැබූ අතර, මෙම නිලධාරියා ප්‍රතිකාර සඳහා  නාරාහේන්පිට පොලිස් රෝහල වෙත ඇතුලත් කර ඇත. පසුව ගින්න මැඩ පැවැත්වීමට පොලිස් නිලධාරීන් කටයුතු කරන ලදී.

මෙලෙස කලහකාරී ලෙස හැසිරෙන ලද පිරිසෙන් තිදෙනෙකු නීති විරෝධී රැස්වීමක සාමාජිකයන් වෙමින් කලහකාරී හැසිරීම සම්බන්ධව කොල්ලුපිටිය පොලිසිය විසින් අත්අඩංගුවට ගන්නා ලදී. පසුව උද්ඝෝෂණයේ යෙදී සිටි පිරිසෙන්  තවත් පුද්ගලයන් දෙදෙනෙකු කොල්ලුපිටිය පොලිස් ස්ථානයට ඇතුළු වී කලහකාරී හැසිරීම හේතුවෙන් එම පුද්ගලයන් දෙදෙනා ද අත්අඩංගුවට ගෙන ඇත. පොලිසිය විසින් උද්ඝෝෂණයේ යෙදී සිටි පිරිස විසුරුවා හැර ඇත.

**අත්අඩංගුවට ගත් පුද්ගලයන් අවුරුදු 43, 44, 50 හා 56 වයස්වල පසුවන යක්කල, රාජගිරිය, බේරුවල හා අනුරාධපුරය ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මේ සම්බන්ධව කොල්ලුපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**